**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පැවරුම්**

**සිංහල - 9 ශ්‍රේණිය**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

## ජනවාරි 4 සතිය

## 2 පාඩම - ලපසේ සඳ විලසේ

❖ පාඩම හොඳින් කියවන්න.

1. කෙටි පිළිතුරු සපයන්න.

- සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද හඳුන්වන්න.
- පද්‍ය යනු මොනවා ද?
- පද්‍ය සඳහා පැරණි කවීන් වස්තුවිෂය කරගනු ලැබුවේ කුමක් ද?
- සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ට ආභාසය කරගත් අනෙකුත් සාහිත්‍යයන් මොනවා ද?
- “වෙස්සන්තර ජාතක කාව්‍යය” නව මගකට පාර පෙන්නූවේය. මෙම කියමනට හේතුව කුමක් ද?

2. ලපසේ සඳ විලසේ පද්‍ය පන්තියේ සඳහන් උපමා දෙකක් ලියන්න.

3. පද්‍ය පාදවල අදහස ලැබෙන සේ යා කරන්න.

| | |
|---|---|
| • ලපසේ සඳ විලසේ | පිය රජ කෙරෙහි දරුවන් තුළ තරහක් නැත. |
| • ගසක දොඩම් මදෙයි<br>කියා කෑදැයි අපෙ අම්මා | දැඩි ස්ථිර සම්බන්ධතාව |
| • අප සේ පිය රජුනි දනට<br>නොදෙන්න අපෙ අම්මා | මව රාජ සම්පත් අත්හැරිය බව |
| • එද ලොබ හැර ඔබ<br>සමගින් තපසට ආවෙම්මා | මව් සෙනෙහස |

4. මෙම කවි පන්තියේ තේරුම් ඔබේ වචනයෙන් ලියන්න

5. වෙස්සන්තර ජාතක කතාව අසා දැනගන්න.

6. මෙහි සඳහන් දරුවන් දෙදෙනා මව වෙනුවෙන් කළ ප්‍රාර්ථනාවන් උපුටා දක්වන්න.

7. පෙම්මා සුරතල් කියමින් දෙ තනේ කිරි බොම්මා

- මෙම කවියේ සඳහන් ගැමි වහරේ වදන් ලියන්න.
- දරුවන් දෙදෙනාට ඇති දුක කුමක් ද?
- දරුවන් ගේ ප්‍රාර්ථනය කුමක් ද?

8. පහත දැක්වෙන අදහස ට ගැළපෙන පද්‍ය පාඨ උපුටා ලියන්න.

- දරුවන් ට ඇති එකම රැකවරණය අම්මා ය.
- මවගේ ගුණ කියා නිමකළ නොහැක.
- දරුවන්ට මදි වේ යැ යි සිතා අම්මා නොකා සිටීම.
- වනයට සුන්දරත්වය ගෙන දුන්නේ අම්මා ය.
- රසවත් අහාරයෙන් දරුවන් පෝෂණය කිරීම.

9. "මගෙ ආදර අම්මා" මාතෘකාවෙන් ගීතයක් හෝ පද්‍ය පන්තියක් ලියන්න.

10. "දෙමව්පියන් ට සළකමු" මාතෘකාවෙන් රචනයක් ලියන්න.